සවියෙන් පෙරට - අපි එකට
*E* - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 8 | පුරවැසි අධ්‍යාපනය | පළමු වාරය | 02. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජය |

**සැකසුම :- එම්. ඒ. ඩී. තිලෝකා දිල්මිණී**
**බප/ හො/ වල්ගම ශ්‍රී සද්ධාතිස්ස ම.වි.**

# ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජය

“ප්‍රජාතන්ත්‍රවාදය” පාලන ක්‍රමයක් මෙන්ම ජීවන ක්‍රමයක්ද වේ. මේ අනුව පහත ආකාරයේ ලක්ෂණ ප්‍රජාතන්ත්‍රවාදි සමාජයක් තුළ දැකිය හැකිය.


*බහුතර මතයට ගරු කිරීම.

*සාකච්ඡා මඟින් තීරණ ගැනීම.

*සමානාත්මතාවය

*ස්වයං විනය

*සහයෝගයෙන් කටයුතු කිරීම.



# ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක් තුළ පවුල සහ පාසල වැදගත් ආයතන දෙකකි.



න්‍යෂ්ටික පවුල



විස්තෘත පවුල



# පවුල තුළ සාකච්ඡා මගින් තීරණ ගන්නා අවස්ථා

## <u>පවුලේ සාමාන්‍ය කටයුතු</u>

* ආහාරවේල් තෝරා ගැනීම හා සැකසීම.
* නිවසේ වැඩකටයුතු සාමූහිකව ඉටුකිරීම.
* නිවස පිරිසිදුව තබාගැනීම.
* විවේකය ගත කිරීම හා විනෝදය.
* අධ්‍යාපන කටයුතු සැලසුම් කිරීම.

# පවුල තුළ සාකච්ඡා මගින් තීරණ ගන්නා අවස්ථා

<u>පවුලේ විශේෂ කටයුතු</u>

*විවිධ උත්සව කටයුතු සංවිධානය.

*ඉඩමක්/ නිවසක් මිලදී ගැනීම.

*නිවසක් තැනීම, වෙනස් කිරීම, අලුත්වැඩියා කිරීම.

*වාහනයක් මිලදී ගැනීම.

*විවාහ මංගල උත්සවයක්.

සැමදෙනාගේ කැමැත්ත මත විමසීම හා එකඟ වීම.

නායකත්වයට ගරු කිරීම.

සහයෝගයෙන් කටයුතු කිරීම.

සාකච්ඡා මගින් නිවැරදි තීරණවලට එළඹීම.

**පාසලක් තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ**

අධ්‍යාපනය, භෞතික සම්පත්, පෙළපොත්, නිල ඇඳුම්, පුස්තකාල ක්‍රීඩා හා වෙනත් පහසුකම් සමානව ලැබීම.





# ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක් හුරු කිරීමට පාසල තුළ ක්‍රියාවට නංවන විෂය සමගාමී ක්‍රියාකාරකම්.

උදා:-

* සාහිත්‍ය සමිති, ආගමික සමිති
* ක්‍රීඩා උත්සවය, අවුරුදු උත්සවය, නිදහස් දිනය.
* ශිෂ්‍ය නායක, පන්ති නායක, විෂය නායක වැනි වගකීම් පැවරීම.
* සෞන්දර්ය අංශයේ තරග සංවිධානය කිරීම.
* සාහිත්‍ය දින තරග (සිංහල භාෂා, ඉංග්‍රීසි භාෂා දින)
* අධ්‍යාපන චාරිකා, ක්ෂේත්‍ර චාරිකා

# ළමා අයිතිවාසිකම් හා යුතුකම්

එක්සත් ජාතීන්ගේ ළමා අයිතීන් පිළිබඳ සම්මුතියට අනුව වයස **අවු. 18ට අඩු** පුද්ගලයෝ, ළමයින් ලෙස පිළිගැනෙති. ස්ත්‍රී, පුරුෂ භේදයකින් තොරව සෑම ළමයෙකුටම හිමිවන අයිතිවාසිකම් **ළමා අයිතිවාසිකම්** නම් වේ.

**ළමා අයිතිවාසිකම් ප්‍රධාන තේමා 4ක් යටතේ දක්වයි.**

- ආරක්ෂාවට ඇති අයිතිය.
- සහභාගීත්වයට ඇති අයිතිය.
- සංවර්ධනයට ඇති අයිතිය.
- පැවැත්මට ඇති අයිතිය.

# ළමා අයිතිවාසිකම් හා යුතුකම්

* එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල (යුනිසෙෆ්) ළමා අයිතිවාසිකම් සුරැකීමට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ආයතනයකි.
* එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පූර්විකාවකින් හා වගන්ති 54න් යුක්තය.



# ළමා අයිතිවාසිකම් සමඟ බැඳුණු යුතුකම්ද ඇත

| ළමා අයිතිවාසිකම් | ළමා යුතුකම් |
|---|---|
| • අධ්‍යාපනය ලැබීම | *හොඳින් අධ්‍යාපන කටයුතුවල නිරත වීම.<br>*ගුරු දෙගුරුන්ට ගෞරව කිරීම.<br>*පාසලේ විනය නීතිරීති හා සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම. |
| • සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම | *පෞද්ගලික සෞඛ්‍ය පිළිබඳ දැනුවත් වීම.<br>*යහපත් සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කිරීම.<br>*සෞඛ්‍ය පුරුදු පිළිබඳ අන් අය දැනුවත් කිරීම. |
| • සමාජ සුරක්ෂිතතාවයෙන් ප්‍රතිලාභ ලබා ගැනීම | *සමාජ සුරක්ෂිතතාව වෙනුවෙන් දායක වීම.<br>*සමාජ සුරක්ෂිතතාව  පිළිබඳ අන් අය දැනුවත් කිරීම. |
| • ආගමික විශ්වාසයක් දැරීමේ නිදහස | *ආගමානුකූල හා යහපත් දිවිපැවැත්ම.<br>*අන් අයගේ ආගමික විශ්වාසයන්ට ගරු කිරිම. |

# ළමා අයිතිවාසිකම් සමඟ බැඳුණු යුතුකම්ද ඇත

| ළමා අයිතිවාසිකම් | ළමා යුතුකම් |
| --- | --- |
| • නිදහස් අදහස් ප්‍රකාශ කිරීම | *සත්‍ය කරුණු ප්‍රකාශ කිරීම.<br>*අන් අයට හානියක් සිදු නොවන අදහස් ප්‍රකාශ කිරීම. |
| • මිතුරු සබඳතාතා පැවැත්වීම | *නැණවත් මිතුරන් තෝරා ගැනීම.<br>*වයසට ගැළපෙන මිතුරන් ඇසුරු කිරීම.<br>*සොරකම්, වංචා හා හිංසාකාරී ක්‍රියාවන්ගෙන් වැළකීම. |
| • සමිති සමාගම් කටයුතුවලට සම්බන්ධ වීම. | *තම හැකියාවන් වර්ධනය කර ගැනීම.<br>*සමාජ සංවර්ධනයට සහය වීම. |
| • නිසි රැකවරණය ලැබීම | *මව්පිය, වැඩිහිටියන්ට ගරු කිරීම හා අවනත වීම.<br>හැකි සෑම විට ම ඔවුන්ට සහාය වීම. |

**අයිතිවාසිකම් භුක්ති විඳීම මෙන්ම යුතුකම් ඉටු කිරීම මගින් පොදු සමාජ යහපැවැත්මක් ඇතිවේ**

# ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ක්‍රියාත්මක වන ආයතන

දරුවන් විවිධ පීඩාවන්ට ගොදුරුවීමට විවිධ කරුණු බලපායි.

* මව්පියන් වෙන් වීම.
* මව්පියන් විදේශගත වීම.
* මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම.
* මව්පියන් මිය යාම.
* මව්පියන් සිරගත වීම.
* දරුවන්ට දක්වන අවධානය අඩුවීම.
* ආර්ථික අපහසුතා.

# ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ක්‍රියාත්මක වන ආයතන

මෙම තත්වයන්ගෙන් දරුවන් මුදවා ගැනීමට විවිධ ආයතන ක්‍රියාත්මකවේ.

*ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය.

*පරිවාස ළමා ආරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව.

*ළමා හා කාන්තා කාර්යාංශය.

*ශ්‍රී ලංකා පොලීසිය.

# ප්‍රාදේශිය මට්ටමින් දරුවන් හා පවුල් සඳහා සේවා සපයන රාජ්‍ය නිලධාරීන්.

| තනතුර | කාර්යාලය | සපයනුලබන සේවා |
|---|---|---|
| ළමා හිමිකම් ප්‍රවර්ධන නිළධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දරුවන්ගේ අයිතීන් හා අදාළ සියලු සේවාවන් හා සම්බන්ධීකරණ සහායන් ලබාදීම. |
| ප්‍රාදේශීය  ළමා ආරක්ෂක නිළධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධ ගැටලු විමර්ශනය හා සහය ලබාදීම. |
| | | |
| මුල් ළමාවිය සංවර්ධන නිළධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | පෙර පාසල් අධ්‍යාපනය හා අනෙකුත් මුල් ළමාවිය සඳහා අදාළ සේවාවන් ලබාදීම. |
| ළමා හා වනිතා කටයුතු අමාත්‍යංශයේ උපදේශන නිළධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ළමයින් හා කාන්තාවන් සඳහා අවශ්‍ය උපදේශන සේවාවන් ලබා දීම. |
| සමාජ සේවා නිළධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දරුවන්ට ද අදාළ වන පරිදි රජයේ විශේෂ සමාජ ශුභ සාධන සේවා සැපයීම. |
| කාන්තා සංවර්ධන නිළධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | කාන්තාවන් හා ගැහැනු දරුවන් සඳහා අවශ්‍ය ගෘහ ආර්ථික හා වෘත්තීය අධ්‍යාපන සේවාවන් ලබාදීම. |
| නොවිධිමත් අධ්‍යාපනය හා විධිමත් අධ්‍යාපනය පිළිබඳ නිලධාරි | කොට්ඨාසඅධ්‍යාපන කාර්යාලය,කලාප අධ්‍යාපන කාර්යාලය | පාසල් නොයන දරුවන් හා විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා පවතින දරුවන් සඳහා අවශ්‍ය සේවාවන් ලබා දීම. |

# විවිධ චිත්තවේග

අපේ සිත තුළ ඇති වන විවිධ සිතුවිලි චිත්තවේග ලෙස හඳුනාගත හැකිය. සිතුවිලිවල ස්වාභාවය මුහුණේ ඉරියව්වලින් පැහැදිලි වේ.

## චිත්තවේග හා ඒ අනුව ඇති වන ප්‍රතික්‍රියා

| චිත්තවේගය | | ප්‍රතික්‍රියා |
|---|---|---|
| සතුට | ⟶ | සිනාසීම, නැටීම, ඔල්වරසන් දීම, සතුටු කඳුළු සැලීම, කෑ ගැසීම, උඩ පැනීම |
| දුක | ⟶ | හැඬීම, සුසුම් හෙළීම, විලාප දීම, මුහුණ මළානික වීම, පපුවට ගසාගැනීම, ඇස් රතු වීම, ඩහදිය දැමීම |
| කෝපය | ⟶ | බැණ වැදීම, පහැදීම, දෙතොල් අතපය වෙව්ලීම, වචන පැටලීම, දත් මිටි කෑම, නිහඬ වීම |
| බිය | ⟶ | ශරීරය වෙව්ලීම, කෑ ගැසීම, ඇස් විශාල වීම, දිවීම, කතා කිරීමට අපහසු වීම, ගොත ගැසීම |



ඉහත දක්වා ඇත්තේ චිත්තවේගවලට ශරීරය බාහිරව දක්වන ප්‍රතික්‍රියාය.

එසේම **ශරීරය අභ්‍යන්තරයේ යම් යම් ප්‍රතික්‍රියා** සිදුවේ.

උදා:-

* රුධිර සංසරණය වේගවත් වීම.
* හෝමෝන ශ්‍රාවය වීම.

## අයහපත් චිත්තවේග දිගුකාලීන පැවතීමේ ප්‍රතිඵල

* කායික රෝග
* මානසික රෝග
* ගැටුම් ඇතිකර ගැනීම්.
* සිරගත වීම.
* මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීම්.
* සියදිවි නසා ගැනීම්.

# අයහපත් චිත්තවේග සමනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

- **මනස සන්සුන් කිරීමේ අභ්‍යාස**
  - භාවනා කිරීම.
  - මල් වැවීම.
  - පරිසරය රසවිඳීම.
  - ආගමික කටයුතුවල යෙදීම.
  - සුරතල් සතුන් ඇති කිරීම.
- **මිතුරන් ඇසුරු කිරීම.**
  - සාකච්ඡා කිරීම.
  - එකිනෙකාට සහය වීම.
  - විවිධ ක්‍රියාකාරකම්වල යෙදීම.
  - චාරිකා යාම.

- අයහපත් චිත්තවේග හටගන්නා පුද්ගල හා පරිසර තත්වයන් වෙනස් කිරීම.
  - නිවස, කාර්යාලය පිරිසිදුව හා පිළිවෙළකට තබා ගැනීම.
  - අසමානතා වෙනස්කම්, අඩුකර ගැනීම.
  - පරිසරය අලංකාර කර ගැනීම.
  - මිත්‍රශීලීව හා සහයෝගයෙන් කටයුතු කිරීම.
  - කාල සටහනකට අනුව වැඩ කිරීම.

- නිර්මාණකරණය සඳහා යොමු වීම.
  - කවි,ගීත රචනා කිරීම, පොත් ලිවීම.
  - සෞන්දර්යය ක්‍රියාකාරකම්වල නිරත විම.
  - ගීත ගායනය , නර්තනය, චිත්‍ර ඇඳීම.
  - නාට්‍ය නිර්මාණ කිරීම, උද්‍යාන අලංකරණය
  - නාට්‍ය චිත්‍රපට නැරඹීම.
- ක්‍රීඩා කටයුතු හා ශාරීරික ව්‍යායාම්වල යෙදිම.
  - ගෘහස්ථ හෝ බාහිර හෝ ක්‍රීඩාවක යෙදීම.
  - ඇවිදීම.
  - ශාරීරික ව්‍යායාම්වල යෙදීම.
  - පිහිනීම.

# චිත්තවේග සුබවාදීව හසුරුවා ගැනීම.

**ජීවිතයේ විවිධ අවස්ථාවල මතුවන හැඟීම් හෙවත් චිත්තවේග.**

* හඳුනා ගැනීමට
* පාලනය කරගැනීම
* උචිත ලෙස ප්‍රකාශ කිරීමට

**අප පුහුණු විය යුතුය.එසේම ඒවා ඵලදායී ලෙස හසුරුවා ගැනීමට පුහුණු විය යුතුය.ඒ සඳහා,**

* පෙර සූදානම
* කාල සටහනකට වැඩ කිරිම.
* අන් අයගේ උදව් හා උපදෙස් ලබා ගැනීම.
* සවන් දීම.
* නීතිරීති හා සිරිත් විරිත් පිළිපැදීම.
* තමා පිළිබඳ විශ්වාසයක් ඇති කර ගැනීම මගින් තම ජීවන අරමුණු කරා පහසුවෙන් ළගා විය හැකිය.

# ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු වීමේ ප්‍රයෝජන

- ආවේගවලට ලක් නොවන සමබර පෞරුෂයකින් හෙබි පුද්ගලයෙකු බවට පත් වේ.
- සැහැල්ලු ගති පැවතුම්, සිනා මුසු ප්‍රියමනාප ඉරියව්, සිත් ඇදගන්නා කතාබහ, ඔබ තුළ නිරායාසයෙන් ඇති වේ.
- අන් අයගේ සිත නොරිදවන පුද්ගලයෙකු බවට පත් වේ.
- අන් අය සමඟ සහයෝගයෙන් හා සාමකාමීව කටයුතු කරයි.
- විශ්වාසයට හා ගෞරවයට පාත්‍ර වෙයි.

# නායකත්වය යනු

- නායකත්වය යනු ජනතාවගේ පැහැදිලි අරමුණක් ඉටු කරගැනීම සඳහා ඔවුන් යොමු කිරීම හා නම්මවා ගැනීම සඳහා ඔවුන් යොමු කිරීම හා නම්මවා ගැනීමේ ක්‍රියාවලියකි.
- ආයතනයක හෝ සංවිධානයක පරමාර්ථය සපුරා ගැනීම සඳහා අන්‍යයන් පෙළඹවීමට, ඔවුන්, ඒ සඳහා කැපවීමට උනන්දු කරවීමට ඇති හැකියාව නායකත්වයයි.
- නායකත්වය වනාහි ක්‍රමවේදයක් හෝ තාක්ෂණික ක්‍රම ශිල්පයක් නොවේ.එය හදවත විවෘත කරගැනීම පිළිබඳ කාරණයකි. ඉන් තමාව මෙන්ම අන්‍යයන් ද උත්තේජනය කළ හැකි ය.
- **"ශ්‍රේෂ්ඨ නායකත්වය" යනු අනුගමනය කළ හැකි ක්‍රමවේදයක් නොවේ. එය මානුෂික වූ අත්දැකීමක් වන අතර, හදවත තුළින් මතුවන එය සෙසු හදවත් හා බැඳෙන මානුෂික ක්‍රියාකාරකමකි.**

# සමාජය තුළ නායකත්ව ලක්ෂණ දැකිය හැකි අවස්ථා

- පවුල තුළ - දෙමාපියන්, වැඩිහිටි දරුවන්
- පාසල තුළ - විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, සහකාර විදුහල්පති, අංශ ප්‍රධානීන්, පන්ති භාර ගුරුතුමා,ශිෂ්‍ය නායකයින්, කළමනාකරණ කමිටු නායනයින්, පන්ති නායනයින්, විෂය නායකයින්
- සමාජය තුළ - ආගමික නායකයින්, ප්‍රජා නායකයින්, දේශපාලන නායකයින්, ආයතන ප්‍රධානීන්

# නායකයෙකු සතුවිය යුතු ගුණාංග

- සන්නිවේදන හැකියාව → ඉදිරිපත් කිරීම, පැහැදිලි කිරීම, කථනය, අනුපිළිවෙළ ගොඩනැගීම, සවන් දීම, ස්ථිරසාර බව
- ගැටලුව විසඳීමේ හැකියාව → ගැටලුව නිවරදිව තේරුම් ගැනීම, තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, විසඳුම් සෙවීම, ක්‍රියාත්මක කිරීම
- සැලසුම් කිරීමේ හැකියාව → අරමුණු තීරණය කිරීම, සැලසුම් කිරීම, සංවිධාන කිරීම, තීරණය ගැනීම
- මෙහෙයවීමේ හැකියාව → ඉලක්ක තීරණය කිරීම, කණ්ඩායම් හැසිරවීම, පාලනය කිරීම, ඉලක්ක කරා ළඟා වීම
- මානව සම්බන්ධතා → සමාජශීලී බව, ආකර්ෂණීය බව, අන්‍යෝන්‍ය සම්බන්ධතා පවත්වා ගැනීමේ හැකියාව, තේරුම් ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම.
- ආවේදනීය හැකියා → මිත්‍රශීලී බව, සුහද බව, සංවේදී බව, ප්‍රබෝධවත් බව

# සමාජය තුළ දැකිය හැකි විවිධ නායකත්ව ශෛලීන්

| ඒකාධිපති නායකත්ව ශෛලිය | දූෂිත නායකත්ව ශෛලිය |
|---|---|
| – පොදු ජනතා අදහස් නොපිළිගැනීම.<br>– වෙනස් වීමට කැමති නොවීම.<br>– ඉතා දැඩිව ක්‍රියා කිරිම.<br>– තර්ජනය කිරීම, බියගැන්වීම.<br>– දක්ෂතා වර්ධනයට ඉඩක් නොදීම. | – පොදු දේපළ අයුතු ලෙස පරිහරණය කිරීම.<br>– සොරකම්, වංචා දූෂණ කටයුතුවල නියැලීම.<br>– වැරදි පූර්වාදර්ශ ප්‍රදර්ශනය කිරීම.<br>– නීතිරීති, සිරිත් විරිත්, සාම්ප්‍රදායන්ට ගරු නොකිරීම.<br>– පෞද්ගලිකත්වයට වැඩි නැඹුරුවක් දැක්වීම. |
| **නාමික නායකත්ව ශෛලය** | **ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය** |
| – ජනතා ශුභසිද්ධියට කටයුතු නොකිරීම.<br>– යහපත් නායකත්ව ගුණාංගවලින් තොරවීම.<br>– පැහැදිලි අරමුණු, ඉලක්ක නොතිබීම.<br>– වෙනස්කම් සිදු නොකිරීම.<br>– තමා කැපී පෙනීමට උත්සහ කිරීම. | – ජනතා අදහස් පිළිගැනීම හා ගරු කිරීම.<br>– ජනතාව සමඟ ඉතා සමීපව කටයුතු කිරීම.<br>– ජනතාව උද්යෝගිමත් කිරීම හා උනන්දු කිරීම.<br>– ප්‍රශ්නවලට සවන්දීම හා ප්‍රශ්න විසඳීම.<br>– ජනතාවගේ දක්ෂතා වර්ධනයට ඉඩ සැලසීම.<br>– නිදහස, සමානාත්මතාව අගය කිරීම හා තහවුරු කිරීම. |

# සමාජයට නායකයන් අවශ්‍ය වන්නේ ඇයි?

- නිවැරදි දර්ශනයක් සහිතව සංවිධානය, ආයතන හා රාජ්‍ය ගොඩනැගීමට.
- ඉලක්ක නිර්මාණය කිරීමට හා ඉලක්ක කරා මෙහෙයවීමට.
- නියමිත පරිදි සැලසුම් කිරීම.
- අභියෝග, විරෝධතා භාරගැනීමට.
- අභියෝග, විරෝධතා ප්‍රජාතන්ත්‍රීයව පාලනය කිරීමට.
- අනුගාමිකයන් ඇද බැඳ තබා ගැනීමට.
- අනුගාමිකයන් උනන්දු කරවීමට.
- සම්පත් නිසි ලෙස බෙදාදීමට හා පරිහරණයට.
- ගැටලු විසඳා දීමට හා අවම කිරීමට

# ප්‍රජාතන්ත්‍රවාදී රටවල්

- ඇමරිකා එක්සත් ජනපදය
- ප්‍රංශය
- බ්‍රිතාන්‍යය
- ස්විට්සර්ලන්තය
- ඉන්දියාව
- ශ්‍රී ලංකාව

මෙම රටවල දේශපාලන නායකයන් තෝරාගන්නේ මැතිවරණ පැවැත්වීමෙනි. එම නායකයන්ගේ පූර්වාදර්ශ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයේ යහපැවැත්මට හේතු වේ.

# ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු සතුවිය යුතු ගුණාංග

මානව හිතවාදී බව

අවංකකම

කැපවීම

සමානාත්මතාව

මිත්‍රශීලී බව

නිර්මාණශීලී බව

නිවැරදි තීරණ ගැනීම

ආත්ම විශ්වාසය

ස්ථිරසාර බව

සවන්දීම

පක්ෂග්‍රාහී නොවීම

සමාජශීලී බව

දුරදක්නා නුවණ

අන් අයට උදවු කිරීම

## නායකයා හා අනුගාමිකයා

- නායකයා කණ්ඩායම මෙහෙයවන්නාය.
- අනුගාමිකයා යනු නායකත්වයට අනුව කටයුතු කරන්නාය
- නායකයා කණ්ඩායම මෙහෙයවන විට අනුගාමිකයා විශ්වාසයකින් යුතුව කටයුතු කිරීමට සූදානම් විම.
- නායකයාට නිවැරදි අරමුණක් කරා ගමන් කිරීමට සහයවීම හා ලාභ අපේක්ෂාවෙන් තොරව කටයුතු කිරීම අනුගාමිකයාගේ යුතුකමකි.
- විශිෂ්ට නායකයෙකු බවට පත්වීමට අනුගාමිකයෙකු ලෙස කැපවීම හා උනන්දුව ඉවහල් වේ.
- නායකයා හා අනුගාමිකයා අන්‍යොන්‍යානය වගකීමෙන් බැඳී පවතී.

# නායකත්වය හා අනුගාමිකත්වය සමාජය තුළ දැකිය හැකි අවස්ථා

| නායකයා | | අනුගාමිකයා |
|---|---|---|
| පියා | - | පවුලේ සෙසු සාමාජිකයන් |
| විදුහල්පති | - | ගුරු මණ්ඩලය, සිසු දරු දැරියන් |
| විහාරාධිපති | - | සෙසු ස්වාමීන් වහන්සේලා, දායක දායකයින් |
| මන්ත්‍රීවරයා | - | ඡන්ද දායකයින් |
| ජනාධිපතිවරයා | - | රටවැසියන් |

# පාසල තුළ දැකිය හැකි නායකයන් සහ අනුගාමිකයන්

| නායකයා | | අනුගාමිකයා |
|---|---|---|
| විදුහල්පති | - | ගුරුමණ්ඩලය,සිසු දරු දැරියන් |
| පන්තිභාර ගුරුවරයා | - | පන්තියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් |
| ශිෂ්‍ය නායකයා | - | පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් |
| පන්ති නායකයා | - | පන්තියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් |
| විෂය නායකයා | - | විෂයය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් |



# ප්‍රජාතන්ත්‍රවාදී දිවිපැවැත්ම

ප්‍රජාතන්ත්‍රවාදී දිවිපැවැත්ම යනු ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංගතම ජීවන පුරුදු බවට පත් කරගෙන සමාජය තුළ යහපත් පුරවැසියෙකු ලෙස කටයුතු කිරීමයි.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක විශේෂ ලක්ෂණය වන්නේ තම යහපත පමණක් නොව අන් අයගේ යහපත පිළිබඳ උනන්දු වීමයි.

## ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අදාළ ගුණාංග

- අන් අයගේ මතයන්ට ගරු කිරීම.
- සහයෝගයෙන් කටයුතු කිරීම.
- අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කිරීම.
- සාකච්ඡා මගින් තීරණවලට එළඹීම.
- ස්වයං විනයකින් යුතුව කටයුතු කිරීම.
- සමානාත්මතාවයට ගරු කිරීම.
- විනිවිදභාවයකින් කටයුතු කිරීම.
- අවංක හා නීතිගරුකව කටයුතු කිරීම.
- අන් අයගේ අයිතිවාසිකම්වලට ගරු කිරීම.
- විවිධ මත ඉවසීම

# ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාව සමාජයේ යහපැවැත්මට හේතුවන ආකාරය

- **ජන සමාජය තුළ සුහදතාවය වර්ධනය වීම.**
  - සෑම ජන කණ්ඩායමක් සඳහා ම එම අවස්ථා ලබාදීම හා ගෞරව කිරීම නිසා සම්බන්ධතා වර්ධනය වීම.
  - තම අවශ්‍යතා අපේක්ෂිත මට්ටමින් ඉටු වීම නිසා ජනතාව තෘප්තිමත් වීම.
  - සෑම කටයුත්තක දී ම සියලු දෙනාගේ දායකත්වය හා නියෝජනය හිමි වීම.
- **ගැටුම් අවම වූ සමාජයක් බිහිවීම.**
  - බහුතර මතයට ගරු කිරීම.
  - සුළු ජන නියෝජනයට ගරු කිරීම.
  - සෑම ජන වර්ගයකටම මෙන්ම සංස්කෘතියකටම ගෞරව කිරීම.

- **නීතිගරුක ජන සමාජය බිහිවීම.**
  - –පුරවැසියන් නීතිගරුක වීම.
  - –සාධාරණව, සාමකාමීව කටයුතු කිරීම.
  - –එකිනෙකා පිළිගැනීම, ගෞරව කිරීම.
- **සියලු දෙනාගෙම අයිතිවාසිකම් ආරක්ෂා වීම.**
  - –අයිතිවාසිකම් පිළිගනියි.
  - –යුතුකම් ඉටු කරයි.
  - –නිදහස අගය කරයි.

**සවියෙන් පෙරට - අපි එකට**
**e - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 8 | පුරවැසි අධ්‍යාපනය | පළමු වාරය | 02.ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජය - ඇගයීම |

**සැකසුම :- එම්. ඒ. ඩී. තිලෝකා දිල්මිණි**
**බප/ හො/ වල්ගම ශ්‍රී සද්ධාතිස්ස ම.වි.**

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ලක්ෂණ තුනක් ලියන්න.
2. පවුල තුළ සහ පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙක බැගින්ලියන්න.
3. පවුලේ සාමාජිකයන් සාකච්ඡා කර තීරණ ගන්නා අවස්ථා තුනක් ලියන්න.
4. පාසලේ ක්‍රියාවට නංවන විෂය සමගාමී ක්‍රියාකාරකම් තුනක් ලියන්න.
5. ළමයෙකු ලෙස සලකන වයස් සීමාව කීයද?
6. ළමා අයිතිවාසිකම්වල ප්‍රධාන තේමා හතර ලියන්න.
7. ළමා අයිතීන් සුරකින ජාත්‍යන්තර ආයතනය කුමක්ද?
8. අධ්‍යාපනය ලැබීමේ අයිතිය හා බැඳුණු ඔබේ යුතුකම් දෙකක් ලියන්න.
9. ළමා අයිතීන් ආරක්ෂා කිරීමට ක්‍රියාත්මක වන ආයතන තුනක් ලියන්න
10. චිත්තවේග හතරක් ලියන්න.
11. අයහපත් චිත්තවේග නිසා ඇතිවන ප්‍රතිඵල තුනක් ලියන්න.
12. අයහපත් චිත්තවේග සමනය සඳහා කළ හැකි දේවල් හතරක් ලියන්න.
13. පාසල තුළ දැකිය හැකි නායකත්වයන් දෙකක් ලියන්න.
14. නායකත්ව ශෛලීන් හතරක් ලියන්න.

**ප්‍රශ්න අංක 15 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යා කරන්න.**

| A | B |
|---|---|
| 15. මෙහෙයවීමේ හැකියාව | ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජය |
| 16. බහුතර මතයට ගරු කිරීම | හැඩීම |
| 17. පාසලයෙහි නියමුවා | නායකත්ව ගුණාංගයකි |
| 18. කෝපය | ඉතා දැඩිව ක්‍රියාකිරිම |
| 19. ඒකාධිපති නායකත්වය | අයහපත් චිත්තවේගයකි |
| 20. දුක | විදුහල්පතිවරයා |

**සවියෙන් පෙරට - අපි එකට**
**e - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| **8** | **පුරවැසි අධ්‍යාපනය** | **පළමු වාරය** | **02. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජය - පිළිතුරු** |

**සැකසුම :- එම්. ඒ. ඩී. තිලෝකා දිල්මිණි**
**බප/ හො/ වල්ගම ශ්‍රී සද්ධාතිස්ස ම.වි.**

1.

* බහුතර මතයට ගරු කිරීම.
* සාකච්ඡා මඟින් තීරණ ගැනීම.
* ස්වයං විනය.

2. <u>පවුල තුළ</u>

* සාමූහිකව නිවසේ කටයුතුවලට හවුල්වීම.
* දෙමාපියන්, වැඩිහිටි නායකත්වයට ගරු කිරීම.

<u>පාසල තුළ</u>

* පාසල තුළ පොදු නීති හා සම්ප්‍රදායන් පිළිගැනීම හා ඒවා ආරක්ෂා කිරීම.
* සැමදෙනාගේ කැමැත්ත විමසීම හා එකඟවීම.

3.

* දානමය පිංකමක් සිදුකිරීම.
* විනෝද ගමන් යාම.
* නිවස අලුත්වැඩියාව.

4.

* ක්‍රීඩා උත්සවය
* විවිධ ප්‍රසංගය
* සිංහල භාෂා දිනය

5. අවු. 18 අඩු.

6.

* ආරක්ෂාවට ඇති අයිතිය.
* සහභාගීත්වයට ඇති අයිතිය.
* සංවර්ධනයට ඇති අයිතිය.
* පැවැත්මට ඇති අයිතිය.

7.

* එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල (UNICEF)

8.

* හොඳින් ඉගෙනගැනීම.
* ගුරුවරුන්ට ගෞරව කිරීම.

9.

* ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
* පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව.
* ශ්‍රී ලංකා පොලීසිය

10. දුක, සතුට, බිය, කෝපය

11.

* මානසික රෝග ඇතිවීම.
* සියදිවි නසාගැනීම.
* සිරගතවීම.

12.

* භාවනා කිරීම
* චාරිකා යාම.
* චිත්‍රපට නැරඹීම.
* පරිසරය රසවිඳීම.

13.

* විදුහල්පතිවරයා
* පන්ති භාර ගුරුවරයා

14.

* ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය.
* ඒකාධිපති නායකත්ව ශෛලිය.
* නාමික  නායකත්ව ශෛලිය.
* දූෂිත නායකත්ව ශෛලිය.

15. මෙහෙයවීමේ හැකියාව - නායකත්ව ගුණාංගයකි.
16. බහුතර මතයට ගරු කිරීම - ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජය
17. පාසලයෙහි නියමුවා - විදුහල්පතිවරයා
18. කෝපය - අයහපත් චිත්තවේගයකි
19. ඒකාධිපති නායකත්වය - ඉතා දැඩිව ක්‍රියාකිරීම.
20. දුක - හැඬීම